# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2017 අගෝස්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2017 අගෝස්තු මස 31 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

***මෙම පනතේ 4 සහ 5 පිටුවල 8 වන වගන්තියට අදාළ නිවැරදි කිරීම් පසු පිටේ දක්වා ඇත.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 17.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

## නිවැරදි කිරීමයි

**8 වන වගන්තිය**

4 පිටුව

*12 වන පේළිය :* "පත්‍රයේ සඳහන්, තෝරා පත් කර ගත යුතු සම්පූර්ණ" වෙනුවට, "**පත්‍රයේ සඳහන්, තෝරා පත් කර ගත යුතු සහ තෝරා යැවිය යුතු සම්පූර්ණ**" යනුවෙන් නිවැරදි විය යුතු ය.

*15 වන පේළිය :* "සඳහන්, තෝරා යැවිය යුතු අපේක්ෂකයන්ගේ" වෙනුවට, "**සඳහන්, අපේක්ෂකයන්ගේ**" යනුවෙන් නිවැරදි විය යුතු ය.

5 පිටුව

*24 වන පේළිය :* "සම්පූර්ණ ප්‍රමාණයෙන් සියයට දහයකට වඩා අඩු" වෙනුවට, "**සහ තෝරා යැවිය යුතු සම්පූර්ණ සහිත සංඛ්‍යාවෙන් සියයට දහයකට වඩා අඩු**" යනුවෙන් නිවැරදි විය යුතු ය.

*26 වන පේළිය :* "යෝජනාපත්‍රයේ සඳහන් තෝරා යැවිය යුතු" වෙනුවට, "**යෝජනාපත්‍රයේ සඳහන්**" යනුවෙන් නිවැරදි විය යුතු ය.

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2017 අගෝස්තු මස 31 වන දින]

එල්.ඩී.-ඕ. 35/2015

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 3ඈ වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ "හෝ අකාරාදිය අනුව වූ ඉංග්‍රීසි අක්ෂර" සහ "හෝ අකාරාදිය අනුව වූ අක්ෂරය ද" යන වචන ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 262 වන අධිකාරයේ 3ඈ වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඈ වන වගන්තියේ, (2) වන උපවගන්තියේ "කොට්ඨාසයේ අලුත් මායිම්, නම්, අංක හෝ අක්ෂර" යන වචන වෙනුවට "එක් එක් කොට්ඨාසයේ අලුත් මායිම්, නම් හෝ අංක" යන වචන ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 3ඈ වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදයේ (iv) වන අනු-ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනු-ඡේදය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ivඅ) යම් පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීමකට අවම වශයෙන් එක් වර්ෂයකට පෙර එම පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ සේවය කිරීම අවසන් නොවූ එම පළාත් පාලන ආයතනය සඳහා නාමයෝජනා ඉල්ලා සිටින ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල නියැලී සිටින රජයේ නිලධරයෙක්,

2—PL 005260 -2,861 (2017/06)

මෙම අනු-ඡේදයේ කාර්යය සඳහා "ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල නියැලී සිටින රජයේ නිලධරයෙක්'' යන්නට සංවර්ධන, සුභසාධන, ආර්ථික, සමාජ සෞඛ්‍ය හෝ ඔහුගේ සේවා නියුක්තියේ විෂයය පථය තුළ වූ වෙනත් ක්‍රියාකාරකම්වල නියැලී සිටින තැනැත්තකු ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ අවසාන අතුරු විධානයේ (ii) වන ඡේදයේ,"නමකින් සහ අකාරාදිය අනුව වූ ඉංග්‍රීසි අක්ෂරයකින්" යන වචන වෙනුවට, "නමකින් සහ අංකයකින්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) "ඡන්ද දිස්ත්‍රික්ක" සහ "ඡන්ද දිස්ත්‍රික්කය" යන වචන යොදා ඇති සෑම ස්ථානයකම, ඒ වචන වෙනුවට පිළිවෙළින්, "ඡන්ද කොට්ඨාස" සහ "ඡන්ද කොට්ඨාසය" යන වචන ආදේශ කිරීමෙන්;සහ

(ආ) (ඇ) වන ඡේදයේ"දිස්ත්‍රික්කයට" යන වචනය වෙනුවට, "ඡන්ද කොට්ඨාසයට" යන වචන ආදේශ කිරීමෙන්.

(3) එම වගන්තියේ (2අ) වන උපවගන්තියේ, "එක් එක් ඡන්ද විමසීම් දිස්ත්‍රික්කයෙහි" යන වචන වෙනුවට, "එක් එක් ඡන්ද කොට්ඨාසයෙහි" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) එම වගන්තියේ (2ආ) වන උපවගන්තියේ, "ඡන්ද ප්‍රදේශයක් ඡන්ද දිස්ත්‍රික්ක සඳහා" යන වචන වෙනුවට "ඡන්ද ප්‍රදේශයක් ඡන්ද කොට්ඨාස සඳහා" යන වචන ආදේශ කිරීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ "පළාත් පාලන ප්‍රදේශ සම්බන්ධයෙන් අනුමත කරන ලද ලකුණු වෙන් කර දෙනු ලබන දිනය, වේලාව සහ ස්ථානය" යන වචන වෙනුවට,''අනුමත කරන ලද ලකුණු, වෙන් කර දෙනු ලබන දිනය, වේලාව, ස්ථානය සහ එක් ස්වාධීන කණ්ඩායමකට වැඩි ගණනක් ඉදිරිපත් වී ඇති අවස්ථාවක දී හඳුනාගැනීමේ අංකයක්," යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27ඊ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:–

ප්‍රධාන ප්‍රඥප්තියේ 27ඊ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''සම්පූර්ණ කාන්තා සභිකයන් ගණන.

27ඊ. (1) මෙම ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුවද එක් එක් පළාත් පාලන ආයතනයේ සම්පූර්ණ සභිකයන්ගෙන් සියයට විසිපහකට නොඅඩු වූ ප්‍රමාණයක් කාන්තා සභිකයන් විය යුතු ය:

එසේ වුවද, යම් පළාත් පාලන ආයතනයක සම්පූර්ණ සභිකයන් ගණනින් සියයට විසිපහක් සංයුක්ත වන ප්‍රමාණය පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, මේ වගන්තියේ කාර්යය සඳහා පූර්ණ සංඛ්‍යාව එම සියයට විසිපහ සංයුක්ත වන සංඛ්‍යාව ලෙස සළකනු ලැබිය යුතු ය.

(2) මැතිවරණ කොමසාරිස්වරයා විසින්, *ගැසට්* පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් එක් එක් පළාත් පාලන ආයතනය සම්බන්ධයෙන් නම් කිරීමට නියමිත කාන්තා අපේක්ෂිකාවන් ප්‍රමාණය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ, "මේ ආඥාපනත යටතේ" යන වචන වෙනුවට, "මේ ආඥාපනතේ 8 වන වගන්තිය යටතේ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ, "(මෙහි මින්මතු "ස්වාධීන කණ්ඩායම" ලෙස හඳුන්වනු ලබන) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් "යන වචනවල සිට "ආකෘතියට සාරානුකූල වූ ආකෘතියකින්-" යන වචන දක්වා ඇති වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(2) යම් පළාත් පාලන ආයතනයක සියලු කොට්ඨාස සම්බන්ධයෙන් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා පත්‍ර දෙකක් ඉදිරිපත් කළ යුතු ය. එම නාමයෝජනා පත්‍රවල, පළමු නාමයෝජනා පත්‍රයේ සඳහන්, තෝරා පත් කර ගත යුතු සම්පූර්ණ සභික සංඛ්‍යාවෙන් සියයට දහයකට නොඅඩු සංඛ්‍යාවක් සහ දෙවන නාමයෝජනා පත්‍රයේ සඳහන්, තෝරා යැවිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාවෙන් සියයට පනහකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තා අපේක්ෂිකාවන්ගෙන් සමන්විත විය යුතු අතර, යම් පළාත් පාලන ආයතනයක සභිකයන් ලෙස තෝරා පත් කරගනු ලැබීමේ කාර්යය සඳහා මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ ආකෘතියකින් —";

(3) (2) වන උපවගන්තියේ (අ) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(අ) එම අපේක්ෂකයන්ගේ නම් සඳහන් කළ යුතු අතර පළාත් පාලන ආයතනයේ එක් එක් කොට්ඨාසය සම්බන්ධයෙන් නම් කරනු ලබන අපේක්ෂකයන් ගණන එම පළාත් පාලන ආයතනයේ සම්පූර්ණ සාමාජිකයන් ගණනින් සියයට හැටකට සමාන විය යුතු ය:

එසේ වුව ද, මෙම ඡේදයේ සඳහන් එම සියයට හැටක් සංයුක්ත වන ගණන පූර්ණ සංඛ්‍යාවක් හා භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම පූර්ණ සංඛ්‍යාව මෙම ඡේදයේ කාර්යය සඳහා සියයට හැට සංයුක්ත වන සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය.";

(4) (2) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ "මේ පනතේ 65අ වගන්තිය" යන වචනවල සිට ඒ උපවගන්තියේ ''නාමයෝජනා පත්‍රයක් භාරදෙනු ලැබිය හැකි ය:'' යන වචන දක්වා සියලු වචන ඉවත් කර ඒ වෙනුවට "තෝරායැවිය යුතු සභිකයන්ගේ නම් සඳහන් කළ යුතු අතර, එම ප්‍රමාණය පළාත් පාලන ආයතනයේ මුළු සභික සංඛ්‍යාවෙන් සියයට හතලිහකට සමාන වූ සහ තවත් අමතර තැනැත්තන් තුන්දෙනකුගේ එකතුවට සමාන විය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන්;

(5) (2) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ අතුරු විධානයේ "සියයට තිහක්" යන වචන වෙනුවට "සියයට හතලිහක්" යන වචන ආදේශ කිරීමෙන්;

(6) එම වගන්තියේ (2අ) උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(2අ) කොමසාරිස්වරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නිවේදනයක් මගින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් පරිදි එක් එක් පළාත් පාලන බල ප්‍රදේශය සම්බන්ධයෙන් පළමු නාමයෝජනා පත්‍රයේ හා අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් කළ යුතු අවම කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව නිශ්චිතව දැක්විය යුතු ය. නම් කිරීමට නියමිත කාන්තා අපේක්ෂිකාවන්ගේ සම්පූර්ණ ගණන පළමු නාමයෝජනා පත්‍රයේ තෝරා ගැනීමට නියමිත සම්පූර්ණ ප්‍රමාණයෙන් සියයට දහයකට වඩා අඩු නොවිය යුතු මෙන්ම අතිරේක නාම යෝජනාපත්‍රයේ සඳහන් තෝරා යැවිය යුතු අපේක්ෂකයන් ගණනින් සියයට පනහකට වඩා අඩු නොවිය යුතු අතර, එම ප්‍රමාණය පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන විට මෙම පනතේ කාර්යය සඳහා නියමිත ගණන වශයෙන් පූර්ණ සංඛ්‍යාව සලකනු ලැබිය යුතු ය.";

(7) එම වගන්තියේ (2ආ) වන උපවගන්තියේ, "නාමයෝජනා පත්‍රය පිටපත් දෙකකින් පිළියෙල කළ යුතු අතර, එහි දෙවන පිටපත මත "පිටපත" යන්න පැහැදිලිව ලිවිය යුතු ය." යන වචන ඉවත් කිරීමෙන්.;

(8) එම වගන්තියේ (2ඇ) වන උපවගන්තියේ "සියයට විසි පහක් කාන්තාවන් සහ තරුණයන්ගෙන් සමන්විත විය හැකි ය." යන වචන වෙනුවට "සියයට තිහකට අඩු නොවන සංඛ්‍යාවක් තරුණයන්ගෙන් සමන්විත විය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(9) එම වගන්තියේ (2ඉ) වන උපවගන්තියේ-

(අ) "සියයට විසිපහ" යන වචන යොදා ඇති සෑම ස්ථානයක ම, "සියයට තිහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ ) "(2ආ) උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(2ඇ) වන උපවගන්තියේ සඳහන්"යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපවගන්තියේ, (අ) වන ඡේදයේ, "සහ කුමන හේතුවක් නිසා වුව ද, නාමයෝජනා කිරීමේ කාලසීමාවේ අවසන් දිනට ඉහතින් ම වූ දින මධ්‍යහන දොළහ පසු නොවී," යන වචන වෙනුවට, "(සහ කුමන හේතුවක් නිසා වුව ද, නාමයෝජනා කිරීමේ කාලසීමාවේ අවසන් දිනට ඉහතින් ම වූ දින මධ්‍යාහ්න දොළහ පසු නොවී)," යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (අ) වන ඡේදයේ, (i) වන අනු-ඡේදයේ, "එක් අයකුට රුපියල් පන්දහසක මුදලක්;" යන වචන වෙනුවට, "එක් අයකුට රුපියල් එක්දහස් පන්සියයක මුදලක්;" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එම උපවගන්තියේ (අ) වන ඡේදයේ (ii) වන අනු-ඡේදයේ, "එක් අයකුට රුපියල් විසිදහසක මුදලක්," යන වචන වෙනුවට, "එක් අයකුට රුපියල් පන්දහසක මුදලක්," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ (ii) වන අනු-ඡේදයේ, "එකී ස්වාධීන කණ්ඩායමේ නායකයා," යන වචන වෙනුවට, "එකී ස්වාධීන කණ්ඩායමේ නායකයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා," යන වචන ආදේශ කිරීමෙන්.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (4) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ, "ඡන්ද කොට්ඨාසයේ" යන වචන වෙනුවට, "කොට්ඨාසයේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම උපවගන්තියේ අතුරු විධානයේ, "එම ඡන්ද කොට්ඨාසයේ" යන වචන වෙනුවට, "ඡන්ද විමසීම් ප්‍රදේශයේ" යන වචන ආදේශ කිරීමෙන්.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (1) වන උපවගන්තියේ (ඉ) වන ඡේදයේ "එම නාමයෝජනා පත්‍රය'' යන වචන වෙනුවට ''එම නාමයෝජනා පත්‍රය; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ඉ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

"(ඊ) මෙම ආඥා පනතේ 28 වන වගන්තියේ (2අ) උපවගන්තිය යටතේ නම් කිරීමට නියමිත සම්පූර්ණ කාන්තා අපේක්ෂිකාවන් ගණන අන්තර්ගත නොවන්නා වූ, නාම යෝජනා පත්‍රය,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, "ඇතුළත්, තනි ලැයිස්තුවක්" යන වචන වෙනුවට "ඇතුළත් නාම යෝජනා පත්‍රයක්" යන වචන ආදේශ කරන්න.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ, "හෝ එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම භාරදෙනු ලැබූ නාමයෝජනා පත්‍රයේ දෙවන ස්ථානයේ නම සඳහන් තැනැත්තා විසින්" යන වචන ඉවත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ, "එම ප්‍රදේශයේ යම් කොට්ඨාසයක ඡන්ද හිමි නාමලේඛනයේ" යන වචන වෙනුවට, "එම ඡන්ද විමසීම් ප්‍රදේශයේ යම් කොට්ඨාසයක ඡන්දහිමි නාමලේඛනයේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) කොට්ඨාසයේ නම සහ අංකය ;".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ, ''ඡන්ද දිස්ත්‍රික්කයක'' යන වචන වෙනුවට, ''ඡන්ද කොට්ඨාසයක" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ, ''ඡන්ද කොට්ඨාසයක්'' සහ ''ඡන්ද කොට්ඨාසය'' යන වචන යොදා ඇති සෑම ස්ථානයක ම ඒ වචන වෙනුවට පිළිවෙළින්, ''කොට්ඨාසයක්" සහ "කොට්ඨාසය" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය, එහි (ඇ) වන ඡේදයේ, "ඒ ඡන්ද කොට්ඨාසයේ" යන වචන වෙනුවට, "ඒ කොට්ඨාසයේ" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ "අපේක්ෂකයන්ගේ නම් සිංහල අකාරාදී අනුපිළිවෙළට ද, ඒ එක් එක් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමට වෙන් කර දී ඇති අනුමත කරන ලද ලකුණ ද" යන වචන වෙනුවට, "අපේක්ෂකයන්ගේ නම් ද එක් එක් පක්ෂයකට හෝ කණ්ඩායමකට වෙන්කර දී ඇති අනුමත කරන ලද ලකුණ ද ස්වාධීන කණ්ඩායම් එකකට වඩා වැඩි ප්‍රමාණයක් සිටින අවස්ථාවක දී නාම යෝජනා පත්‍රයේ සඳහන් පරිදි එක් එක් කණ්ඩායමකට වෙන්කර දී ඇති හඳුනාගැනීමේ අංක ද" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (අ) වන ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) ඡන්ද විමසීමට තරග කරන පිළිගත් දේශපාලන පක්ෂවල නම්, සිංහල අකාරාදී අනුපිළිවෙළට සකස් කොට, ඒ ඒ පක්ෂයේ නමට කෙළින්, ඒ ඒ පක්ෂයට වෙන්කර දී ඇති ලකුණ සමග සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් ඇතුළත් විය යුතු අතර, ඊට ඉක්බිතිව ම, ඡන්ද විමසීම සඳහා තරග කරන "ස්වාධීන කණ්ඩායම්" ඇත්නම්, ඒ එක් එක් කණ්ඩායම සඳහා "ස්වාධීන කණ්ඩායම" යන

වචන නැවත සඳහන් කොට, අනුක්‍රමික අංක අනුපිළිවෙළ අනුව ඒ එක් එක් කණ්ඩායම සඳහා වූ හඳුනාගැනීමේ අංකයද ඊට කෙලින් යොදන ලද ඒ එක් එක් කණ්ඩායමට වෙන් කර දී ඇති ලකුණ ද එහි ඇතුළත් විය යුතු අතර, එම ලකුණ ඉදිරියෙන් ඡන්දය සලකුණු කිරීම සඳහා හිස් කොටුවක් ද ඇතුළත් කර තිබිය යුතු ය. ඡන්ද දායකයකු විසින් එම ලබා දී ඇති කොටුව තුළ ඡන්දය සලකුණු කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "එක් එක් ඡන්ද පොළක ඡන්ද ගණන් කිරීම ඒ එක් එක් ඡන්ද පොළෙහි සිදු කළ යුතු ය". යන වචන වෙනුවට, "එක් එක් කොට්ඨාසයක ඡන්ද පොළවල් එකකට වඩා ඇති අවස්ථාවක දී එක් එක් ඡන්ද පොළක ඡන්ද ගණන් කිරීම අදාළ තේරීම්භාර නිලධරයා විසින් තීරණය කරන පරිදි, සිදුකළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ, "කාර්ය මණ්ඩලය ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය වශයෙන් කටයුතු කළ යුතු ය." යන වචන වෙනුවට, "කාර්ය මණ්ඩලය ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය වශයෙන් කටයුතු කළ යුතු ය. කෙසේ වුවත්, එම ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයට හෝ එම කාර්ය මණ්ඩලයේ සිටින නිලධරයකුට එම ඡන්ද පොළේ කටයුතු කරගෙන යාමට නොහැකි බව හෝ එම කටයුතු කිරීමට නුසුදුසු බව හෝ තේරීම්භාර නිලධරයාට හැඟීයන්නේ නම්, එම ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය වෙනුවට වෙනත් ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයක් හෝ එම කාර්ය මණ්ඩලයේ සිටින නිලධරයකු වෙනුවට වෙනත් නිලධරයකු හෝ තේරීම්භාර නිලධරයා විසින් පත් කරනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (4) වන උපවගන්තියේ,"මැතිවරණ කොමසාරිස්වරයා විසින්" යන වචනවල සිට එම

උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කර හා ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"හෝ යම් ඡන්ද පොළකට පත්කර ඇති ගණන් කිරීමේ නිලධරයාට එම ගණන් කිරීමේ කටයුතු සිදුකරගෙන යාමට නොහැකි බව හෝ එම නිලධරයා ගණන් කිරීමේ නිලධරයා වශයෙන් කටයුතු කිරීමට නුසුදුසු බව තේරීම්භාර නිලධරයාට හැඟීයන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි පළමුව සඳහන් කළ නිලධරයා වෙනුවට ගණන් කිරීමේ නිලධරයකු ලෙස කටයුතු කිරීම සඳහා වෙනත් යම් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ සහකාර තේරීම්භාර නිලධරයකු, තේරීම්භාර නිලධරයා විසින් පත්කරනු ලැබිය හැකි ය.".

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ, "ඡන්දය දීම අධීක්ෂණය කරනු ලබන තේරීම්භාර නිලධාරියා විසින් පත්කරනු ලබන සහකාර තේරීම්භාර නිලධරයා වෙත එම කරුණ දැන්විය යුතු අතර, ඉන්පසුව එම සහකාර තේරීම්භාර නිලධරයා" යන වචන වෙනුවට "ඡන්දය දීම අධීක්ෂණය කරනු ලබන සහකාර තේරීම්භාර නිලධරයා විසින් තේරීම්භාර නිලධරයා වෙත එම කරුණ දැන්විය යුතු අතර, ඉන්පසුව එම තේරීම්භාර නිලධරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ, "එම සහකාර තේරීම්භාර නිලධරයා විසින්" යන වචන වෙනුවට, "එම සහකාර තේරීම්භාර නිලධාරයා විසින් තේරීම්භාර නිලධරයා වෙත ද සහ ඉන්පසුව" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ, "අලුත් ස්ථානයෙහි ඡන්ද ගණන් කිරීම ඡන්ද පොළෙහි ඡන්ද

ස්ථානාධිපතිවරයා විසින්" යන වචන වෙනුවට, "අලුත් ස්ථානය පිළිබඳව තේරීම්භාර නිලධරයා වෙත දැන්වීමෙන් අනතුරුව අධීක්ෂණය කරනු ලබන සහකාර තේරීම්භාර නිලධරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට අලුත් ස්ථානයෙහි ඡන්ද ගණන් කිරීම ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය, එහි (3) වන උපවගන්තියේ, "ඡන්ද කොට්ඨාසයේ" යන වචන වෙනුවට, "කොට්ඨාසයේ" යන වචනය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ, "ඡන්ද කොට්ඨාසය" යන වචන වෙනුවට, "කොට්ඨාසය" යන වචනය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ, "64 වන වගන්තියේ සඳහන් ලේඛන" යන වචන සහ ඉලක්කම වෙනුවට, "64 වන වගන්තියේ සඳහන් ලේඛන සහ නවවන උපලේඛනයේ 28(ඇ) වන නියෝගය යටතේ වූ ප්‍රකාශය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්,මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65අඅ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 65අඅ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:–

"කාන්තා සභිකයන් වෙන් කිරීම.

65 අඅ. (1) පළාත් පාලන ආයතනයක් සඳහා යම් පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් තෝරා පත්කර ගත් සභිකයන් සංඛ්‍යාව, 65 ආ වගන්තියේ (3) උපවගන්තිය යටතේ

නිශ්චිත වශයෙන් තෝරා පත්කර ගත යුතු සහ තෝරා යැවිය යුතු සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවක දී, යම් කාන්තා සභිකයකු ඇතුළත් නොවන අවස්ථාවක, එවිට මේ පනතේ (3) වන (4) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් පළාත් පාලන ප්‍රදේශයක ප්‍රකාශ කරන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට විස්සකට අඩු ප්‍රමාණයක් ලබාගෙන ඇති සහ සභිකයන් තුන් දෙනකු තෝරා පත්කර ගෙන හෝ තෝරා යවනු ලැබ ඇති අවස්ථාවක දී, (3) වන සහ (4) වන උපවගන්ති ප්‍රකාරව එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් කාන්තා සභිකයන් තෝරා යැවීම අවශ්‍ය නොවන්නේ ය.

(3) මේ වගන්තියේ (2) වන උපලේඛනයේ සඳහන් කරන ලද දේශපාලන පක්ෂ සහ ස්වාධීන කාණ්ඩායම් හැර පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වලින් එක් එක් පළාත් පාලන ආයතනයට තෝරා පත්කර ගනු ලබන සහ තෝරා යවනු ලබන කාන්තා සභිකයන් වෙන් කිරීම ඒ පළාත් පාලන ආයතනවල සියලු කොට්ඨාසවල වෙනත් පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාව සහ එයට අදාළ විය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාවේ දක්වා ඇති ක්‍රමය අවශ්‍ය වෙනස්කම් සහිතව සැලකිල්ලට ගනිමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කළ යුතු ය.

(4) මේ වගන්තියේ (1) වන හෝ (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් නොවන යම්

පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් යම් පළාත් පාලන ප්‍රදේශයක සියලු කොට්ඨාස සඳහා තෝරා පත්කර ගත් කාන්තා සභිකයන් සංඛ්‍යාව, (3) වන උපවගන්තියේ නියමයන්ට අනුව බෙදු වෙන් කරන ලද සංඛ්‍යාවට වඩා අඩුවන අවස්ථාවක දී, එම අඩුවන සාමාජිකයන් සංඛ්‍යාව, 9 වන වගන්තිය යටතේ සභිකයකු වීම සඳහා නුසුදුසු වන්නා වූ කාන්තා අපේක්ෂිකාවන් හැර පළමු නාමයෝජනාපත්‍රයේ හෝ අතිරේක නාමයෝජනාපත්‍රයේ වූ කාන්තා අපේක්ෂිකාවන් අතරින් යැවිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 65ආ වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (2) වන, (3) වන, (4) වන සහ (5) වන යන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"(2) පළාත් පාලන ඡන්ද විමසීමක දී එක් එක් දේශපාලන පක්ෂයේ සහ ස්වාධීන කණ්ඩායමේ සියලු අපේක්ෂකයන් ලබාගත් සම්පූර්ණ වලංගු ඡන්ද සංඛ්‍යාව එම පළාත් පාලන බල ප්‍රදේශය සඳහා තේරී පත්විය යුතු සහ තෝරා යැවිය යුතු මුළු සභිකයන් සංඛ්‍යාවෙන් බෙදනු ලැබිය යුතු ය. (යම් භාගයක් ඉතිරි වුවහොත්, එය සැලකිල්ලට නොගෙන) එම ලැබෙන සංඛ්‍යාව මෙහි මින්මතු මේ වගන්තියෙහි "තීරක අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.".

(2) (i) (6) වන උපවගන්තිය (3) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ii) එසේ නැවත අංක යෙදූ (3) වන උපවගන්තියෙහි —

"එක් එක් පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයින් ලබාගත් ඡන්ද සංඛ්‍යාවේ එකතුව'' (1) වන උපවගන්තිය

ප්‍රකාර එකී පළාත් පාලන ආයතනයේ සාමාජිකයන් ලෙස අවස්ථාවෝචිත පරිදි එකී පිළිගත් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් තෝරාගනු ලැබීමට හිමිකම ඇති තැනැත්තන් සංඛ්‍යාව" යන වචන වෙනුවට, "අදාළ පළාත් පාලන බල ප්‍රදේශයේ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ සහ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයින් ලබාගත් ඡන්ද සංඛ්‍යාවේ එකතුව, අදාළ පළාත් පාලන බල ප්‍රදේශයේ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් තෝරා පත්කර ගනු ලැබීමට සහ තෝරා යැවීමට හිමිකම ඇති තැනැත්තන් සංඛ්‍යාව" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"(4) (3) වන උපවගන්තියේ ප්‍රකාරව අවස්ථාවෝචිත පරිදි එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් අදාළ පළාත් පාලන ආයතනයේ සභිකයන් ලෙස තෝරා පත්කර ගැනීමට සහ තෝරා යැවීමට හිමිකම් ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව තහවුරු කර ගැනීමේ දී එම පළාත් පාලන ආයතනය සඳහා එම පිළිගත් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ ඍජුවම තෝරා පත්කරගනු ලැබූ සභිකයන් සංඛ්‍යාව —

(අ) (3) වන උපවගන්තිය යටතේ සභිකයන් ලෙස තෝරා පත්කර ගත යුතු සහ තෝරා යැවිය යුතු බවට තහවුරු කර ගත් සභිකයන් සංඛ්‍යාවට වඩා වැඩි නම්, එම වැඩිපුර සිටින සංඛ්‍යාව මැතිවරණ කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය ; හෝ

(ආ) (3) වන උපවගන්තිය යටතේ සභිකයන් ලෙස තෝරා පත්කර ගත යුතු සහ තෝරා යැවිය යුතු බවට තහවුරු කර ගත් සංඛ්‍යාවට වඩා අඩු නම්, එම අමතරව අවශ්‍ය වී ඇති සභිකයන්

සංඛ්‍යාව, අදාළ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් අවස්ථාවෝචිත පරිදි තේරී පත් වී ඇති අපේක්ෂකයන් හැර 9 වන වගන්තිය යටතේ සභිකයකු වශයෙන් තේරීමට නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයන්, පළමු නාම යෝජනා පත්‍රයේ හෝ අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් අපේක්ෂකයන් අතරින් තෝරා යැවිය යුතු ය.

(4) (i) (7) වන උපවගන්තිය එම වගන්තියේ (5) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ii) නැවත අංක යෙදූ (5) වන උපවගන්තියෙහි —

(අ) "(5) වන උපවගන්තිය සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(3) වන උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) "(3) වන උපවගන්තියේ යටතේ තෝරාගැනීම සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(4) වන උපවගන්තිය යටතේ තෝරාගැනීම සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) "(6) වන උපවගන්තිය යටතේ ලබාගත්" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(3) වන උපවගන්තියේ යටතේ ලබාගත්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(5) (i) (8) වන සහ (9), උපවගන්ති වන එම වගන්තියේ (6) වන සහ (7) වන උපවගන්ති ලෙස නැවත අංක යෙදීමෙන් ;

(ii) නැවත අංක යෙදූ (6) වන උපවගන්තියේ" (5) වන උපවගන්තිය යටතේ සභිකයකු තෝරාගනු ලැබීමට හිමිකම ඇති පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයාට" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ වචන වෙනුවට "තේරී පත් වී ඇති හෝ (9) වන වගන්තිය යටතේ සභිකයකු වශයෙන් තේරී පත්වීමට නුසුදුස්සකු නොවන අපේක්ෂකයන් හැර,

අවස්ථාවෝචිත පරිදි එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් පළමු නාමයෝජනා පත්‍රයෙන් හෝ අතිරේක නාමයෝජනා පත්‍රයෙන් තෝරා පත්කර ගැනීමට හෝ තෝරා පත්කර යැවීමට හිමිකම් ලබා ඇති කාන්තා සභිකයන් ඇතුළුව යම් සභිකයන් ප්‍රමාණයක් මෙම වගන්තියේ (3) වන උපවගන්තිය සහ 65අඅ වගන්තියේ (3) උපවගන්තිය යටතේ තෝරා පත්කර යැවීමට හිමිකම් ඇත්තේ ය".

(6) එම වගන්තියේ පැති සටහන ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"තෝරා ගනු ලැබීමට සහ තෝරා පත් කර යැවීමට හිමිකම් ලබන අපේක්ෂකයන්.".

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 66අ වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) (1) වන උපවගන්තියේ (අ) වන ඡේදයෙහි "එම ආඥාපනතේ පළාත් පාලන ආයතනයේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට සුදුසුකම් ඇත්තා වූ වෙනත් යම් තැනැත්තකු" යන වචන වෙනුවට "තේරී පත් වී ඇති හෝ 9 වන වගන්තිය යටතේ සභිකයකු වශයෙන් තේරී පත්වීමට නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයන් හැර පළමු නාම යෝජනා පත්‍රයේ හෝ අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් වෙනත් යම් අපේක්ෂකයකු සභිකයකු වශයෙන් තෝරා පත් කර ගැනීමට" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයෙහි-

(i) "(ආ) ඡේදය යටතේ නම් කර ඇති තැනැත්තන් අතුරින් එක් අයකු" යන වචන වෙනුවට "(ආ) ඡේදය ප්‍රකාරව තේරීපත් වී ඇති හෝ 9 වන වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයන් හැර පළමු නාම යෝජනා පත්‍රයේ හෝ අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් වෙනත් යම් අපේක්ෂයකු," යන වචන ආදේශ කිරීමෙන්,

(ii) "(252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥා පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ (252 වන අධිකාරය වූ) නගර සභා ආඥා පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ" යන වචන වෙනුවට "(252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ හෝ (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදය යටතේ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(iii) "තවද, එසේ නාමයෝජනා කරනු ලැබීම සඳහා" යන වචනවල සිට "ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලා සිටිය යුතු ය" යන වචන දක්වා සියලු වචන ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"එසේ වුවද, යම් පළාත් පාලන ආයතනයක කාන්තා සභිකයකු සම්බන්ධයෙන් පුරප්පාඩුවක් ඇති වී ඇති අවස්ථාවක දී, තේරී පත්වී ඇති හෝ 9 වන වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති කාන්තා අපේක්ෂිකාවන් නොවන්නා වූ ද, පළමු නාමයෝජනා පත්‍රයේ හෝ අතිරේක නාම යෝජනා පත්‍රයේ නම් සඳහන් වූ ද, කාන්තා අපේක්ෂිකාවන් නම් කිරීමෙන් පමණක් එකී පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය.";

(ඇ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය ඉවත් කිරීමෙන්;

(ඈ) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) පළමු නාම යෝජනා පත්‍රයේ සහ අතිරේක නාමයෝජනා පත්‍රයේ සඳහන් අපේක්ෂකයන්ගෙන් (1) වන උපවගන්තියේ සඳහන් යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා නම් කිරීමට කිසිදු තැනැත්තකු නොමැති

අවස්ථාවක දී, එම පළාත් පාලන ආයතනය පිහිටා ඇත්තා වූ ඡන්ද ප්‍රදේශය සඳහා පත් කරන ලද තේරීම් භාර නිලධාරියා විසින්, එම පුරප්පාඩුව ඇති වීමේ දින සිට දින තිහක කාලයක් ඇතුලත, එම පුරප්පාඩුව ඇතිවූ කොට්ඨාසය සඳහා එම පුරප්පාඩුව පිරවීමට මේ පනතේ 8 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබන වෙනත් යම් තැනැත්තෙකු එම ඉල්ලීමේ දින සිට දින තිහක් ඇතුළත නම් කරන ලෙස එම පුරප්පාඩුව සිදුවූ සාමාජිකයා අයත්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය යුතු යඃ

එසේ වුවද, යම් පළාත් පාලන ආයතනයක කාන්තා සභිකයකු සම්බන්ධයෙන් පුරප්පාඩුවක් ඇති වී ඇති අවස්ථාවක් වන විට මේ පනතේ 8 වන වගන්තිය යටතේ සුදුසුකම් ලබන කාන්තා අපේක්ෂිකාවක් නම් කිරීමෙන් පමණක් එකී පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය.".

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66ආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 66ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) "පළාත් පාලන ආයතනයේ නිල කාලසීමාව ඇතුළත පුරප්පාඩු වන අවස්ථාවක දී, කොමසාරිස්වරයා විසින්" යන වචන වෙනුවට, "පළාත් පාලන ආයතනයේ නිල කාලසීමාව ඇතුළත පුරප්පාඩු වන අවස්ථාවක දී, ඒ පුරප්පාඩුව ඇති වූ බව පළාත් පාලන කොමසාරිස්වරයා විසින් තේරීම්භාර නිලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර, තේරීම්භාර නිලධරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) "දින තිහක් ඇතුළත දී කොමසාරිස්වරයාට දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිය යුතු ය. එම තීරණය ලැබීමෙන් පසුව, එම පළාත් පාලන ආයතනයේ අවස්ථාවෝචිත පරිදි, නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් සඳහන් කර ඇති සභිකයාගේ නම කොමසාරිස්වරයා විසින්"

යන වචන වෙනුවට, "දින තිහක් ඇතුළත දී තේරීම්භාර නිලධරයාට දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිය යුතු ය. එම තීරණය ලැබීමෙන් පසුව, එම පළාත් පාලන ආයතනයේ, අවස්ථාවෝචිත පරිදි, නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් සඳහන් කර ඇති සභිකයාගේ නම තේරීම්භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු ය."

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ, "කොමසාරිස්වරයා විසින් අවස්ථාවෝචිත පරිදි" යන වචන වෙනුවට, "තේරීම්භාර නිලධරයා විසින් අවස්ථාවෝචිත පරිදි" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (4) වන උපවගන්තියේ, "එම උපවගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටිය ප්‍රකාරව එම පුරප්පාඩුව පුරවනු ලැබ ඇති අවස්ථාවක දී සහ ඉහත කී වගන්ති යටතේ එකී යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා එසේ පත්කර ගනු ලැබූ යම් නගරාධිපතිවරයකු සිය ධුරයෙන් ඉල්ලා අස් වූ ලෙස සලකනු ලබන විටෙක එසේ ඇතිවන පුරප්පාඩුවක් මෙම වගන්තියේ (2) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් කාර්ය පටිපාටිය අනුව පුරවනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට, "මෙම ආඥාපනතේ නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටිය ප්‍රකාරව, නගරාධිපති ධුරයේ ඇති වූ එකී පුරප්පාඩුව පුරවනු ලැබ ඇති අවස්ථාවක දී, සහ එලෙස ඇති වූ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කර ගනු ලැබූ යම් සභිකයකු ඔහු විසින් ම සිය ධුරයෙන් ඉල්ලා අස් වූ අවස්ථාවක දී එසේ ඊට පසුව ඇතිවන පුරප්පාඩුව මෙම ආඥාපනතේ නිශ්චිතව සඳහන් කාර්ය පටිපාටිය අනුව පුරවනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 72අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72අ වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ, "විවෘත" යන වචනය වෙනුවට "ආරම්භ" යන වචනය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ, 81ආ වන වගන්තිය, එහි (1අ) වන උපවගන්තියේ, (අ) වන ඡේදය ඉවත් කරනු ලැබීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරනු ලැබීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 81ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) (i) යම් රාජ්‍ය ආයතනයකට කරනු ලබන කිසිදු පත්කිරීමක් යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් මනාපය ප්‍රකාශ කිරීමට ඡන්ද දායකයන්ට බලපෑම් කිරීමට පෙළඹවීමක් තිබිය හැකිවන්නා වූ ලෙසින් සිදු නොකළ යුතු ය;

(ii) ඉහත (i) වන අනු-ඡේදයේ කුමක් සඳහන්ව ඇතද එවැනි ආයතනයකට කරනු ලබන යම් පත්වීමක් ඉතා හදිසි සහ ඒවා කල්දැමීමෙන් මහජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතය බිඳවැටීමක් හෝ උග්‍ර සෞඛ්‍ය උපද්‍රවයකට හෝ මහජනතාවට හානියක් සිදුවීමට හේතුවිය හැකි වන්නාවූ යම් අත්‍යවශ්‍ය සේවාවක් කරගෙන යාමේ කාර්යයක් වෙනුවෙන් සිදුකළ හැකි ය.".

**31.** 2012 අංක 22 දරන පනතින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ "අනුමත ලකුණ" යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

""බලයලත් නියෝජිතයා" යන්න අවස්ථාවෝචිත පරිදි පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් හෝ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ බලයලත් නියෝජිතයා වීමට ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ ඒ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් යම් තැනැත්තකුට ප්‍රකාශිතව ලියවිල්ලකින් බලය දී ඇත්තේ ද, සහ එසේ බලය දෙන ලද බව නාමයෝජනා කිරීමේ කාලසීමාව ආරම්භ වීමට යටත් පිරිසෙයින් පැය හැත්තෑදෙකකට පෙර එම ලේකම් හෝ එම කණ්ඩායමේ නායකයා විසින් ඡන්ද විමසීම පැවැත්වෙන ඡන්ද ප්‍රදේශයේ තේරීම්භාර නිලධරයා වෙත දැනුම් දී ඇත්තේ ද, එවැනි තැනැත්තෙක් අදහස් වේ;".

(2) එම වගන්තියේ "මහනගර සභාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

'""වැඩිපුර සිටින සංඛ්‍යාව" යන්නෙන් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමකින් එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් 65 ආ (3) වගන්තිය ප්‍රකාරව තෝරා පත්කිරීම සඳහා හිමිකම් ලබන සභිකයන් ගණන ඉක්මවමින් පළාත් පාලන ආයතන සඳහා තේරී පත්වන අපේක්ෂකයන් ගණන අදහස්වේ;

(3) එම වගන්තියේ "තත්කාලයේ බලපවත්නා පාර්ලිමේන්තු ලේඛනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:-

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"රාජ්‍ය ආයතනය" යන්නට, අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් සභාවක් මගින් හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් මගින් පිහිටවනු ලැබූ යම් ආයතනයක්, පළාත් පාලන ආයතනයක්, රජයට පවරා ගත් යම් වෙළෙඳ ව්‍යාපාරයක් හෝ රජයට පවරාගත් වෙනත් ව්‍යාපාරයක් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන්නා වූ ද, රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් සියයට පනහකට වැඩි කොටස් දරන්නා වූ ද, යම් සමාගමක් ද ඇතුළත් වේ;".

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

"**පළමුවන උපලේඛනය** [28 (2) වන වගන්තිය]

1 - පළමු නාම යෝජනා පත්‍රය

................................................................................................... මහ නගර සභාව/ නගර සභාව/ ප්‍රාදේශීය සභාව.

පිළිගත් දේශපාලන පක්ෂයක් වන ............. .......................................................... පක්ෂය විසින්/ (ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට ස්වාධීන කණ්ඩායමේ නායකයා වන ............................................................) විසින් ............................................................ මහ නගර සභාවේ/ නගර සභාවේ/ ප්‍රාදේශීය සභාවේ සභිකයින් තෝරා ගැනීම සඳහා අපේක්ෂකයින් වශයෙන් පහත දැක්වෙන තැනැත්තන් මෙයින් නාම යෝජනා කරනු ලැබේ-

**I - අපේක්ෂකයන්**

| 1 | 2 | 3 | | | | | | | | | | | | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නම සහ කොට්ඨාසයේ අංකය "*" | නම - පිරිමි/ කාන්තා (ජාතික හැඳුනුම් පතේ හෝ උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි) | ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | | පදිංචි ලිපිනය | රැකියාව | තරුණ අපේක්ෂකයකු වන හෝ නොවන බව (Y) | අපේක්ෂකයාගේ කැමැත්ත පෙන්නුම් කිරීම සඳහා තබන අත්සන | පිරිමි/ කාන්තා |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | |

## II - අතිරේක නාමයෝජනා පත්‍රය

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|
| නම - පිරිමි/ කාන්තා (ජාතික හැඳුනුම් පතේ හෝ උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි) | ජාතික හැඳුනුම්පත් අංකය | පදිංචි ලිපිනය | රැකියාව | තරුණ අපේක්ෂක යකු වන හෝ නොවන බව (Y) | අමතර තැනැත්තන්ගේ කැමැත්ත පෙන්නුම් කිරීම සඳහා තබන අත්සන | පිරිමි/ කාන්තා |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

මෙම නාමයෝජනා පත්‍රයෙහි නම සඳහන් සියලු තරුණ අපේක්ෂකයන් ආඥාපනතේ 89 වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති වයස් සීමාව තුළ සිටින බවට මම මෙයින් සහතික කරමි.

පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගේ/ ස්වාධීන කණ්ඩායම් නායකයාගේ -

අත්සන : ............................................................
නම : ............................................................
ලිපිනය : ............................................................
නිල මුද්‍රාව : ............................................................

ඉහත නම සඳහන් ............................................................ යන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්/ ස්වාධීන කණ්ඩායම් නායක විසින් 20............ මස ..................... දින මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

............................................................

(සාම විනිසුරු/දිවුරුම් කොමසාරිස්)
නිල මුද්‍රාව

ලිපිනය .......................................................

*කොට්ඨාසය බහු සභික කොට්ඨාසයක් නම් තරු සලකුණු එකක් (*) යොදා සභිකයින් දෙදෙනෙකු තෝරා පත්කර ගැනීමේ දී අදාළ කොටුවෙහි අපේක්ෂකයන් දෙදෙනෙකුගේ නම් ඇතුළත් කරන්න. සභිකයින් තිදෙනකු තෝරා පත්කර ගැනීමේ දී අදාළ කොටුවෙහි තරු සලකුණු දෙකක් (**) යොදා අපේක්ෂකයන් තිදෙනෙකුගේ නම් ඇතුළත් කරන්න".

33. ප්‍රධාන ප්‍රඥප්තියේ නමවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එම උපලේඛනයේ 17 වන නියෝගයේ, "ඡන්ද විමසීම අවසන් වීමට පෙර" යන වචන වෙනුවට, "ඡන්ද විමසීම ආරම්භවීමට පැය හැත්තෑ දෙකකට පෙර" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපලේඛනයේ 18 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු ආවරණ ලියුම් කවර කොට්ඨාස අනුව වර්ග කිරීම

18. තේරීම්භාර නිලධාරියා විසින් විවෘත නොකරන ලද ආවරණ ලියුම් කවර තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටි තුළට බහාලීමෙන් පසුව සහ ඡන්ද විමසීම ආරම්භවීමට පෙර ඕනෑම වේලාවක,තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටි විවෘත කර ඒවායේ ඇති ආවරණ ලියුම් කවර එක් එක් කොට්ඨාස අනුව වෙන් කළ යුතු ය. ආවරණ ලියුම් කවර වෙන් කිරීම නිම වූ විට, තේරීම්භාර නිලධරයා විසින් එම එක් එක් කොට්ඨාසයට අදාළ ආවරණ ලියුම් කවර, ඒ ඒ කොට්ඨාසය සඳහා වෙන වෙනම කවරයක බහා මුද්‍රාව තබා ඡන්ද පත්‍රිකා සහ වෙනත් බඩු බාහිරාදිය සමග ඡන්ද විමසීමේ දිනයට පෙර දින අදාළ කොට්ඨාසය සඳහා පත් කරනු ලැබූ ගණන් කිරීමේ නිලධරයා වෙත භාර දිය යුතු ය.";

(3) එම උපලේඛනයේ 19 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"තැපැල් ඡන්ද පත්‍රිකා ගනන් කිරීම.

19. තේරීම්භාර නිලධරයා විසින්, ඡන්ද පත්‍රිකා ගණන් කිරීම ආරම්භ කිරීමට පෙරාතුව ම, ඉක්මණින් කොට්ඨාසය සඳහා පත් කර ඇති ඡන්ද ගණන් කිරීමේ නිලධරයා මගින් කොට්ඨාසයට අදාළ තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු ආවරණ ලියුම් කවර විවෘත කරවා ඡන්දය ගණන් කිරීම ඉදිරියට කරගෙන යා යුතු ය.";

(4) එම උපලේඛනයේ 20 වන, 21 වන, 22 වන, 23 වන නියෝග සහ 24 වන නියෝගයේ (1) වන ඡේදය ඉවත් කිරීමෙන්;

(5) එම උපලේඛනයේ 28 වන නියෝගයේ (ඇ) වන ඡේදය වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) එක් එක් අපේක්ෂකයන්ට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශය; ";

(6) එම උපලේඛනයේ "අ" වන ආකෘතියේ -

(අ) "ඡන්ද ප්‍රදේශය, ඡන්ද කොට්ඨාසය" යන වචන වෙනුවට, "ඡන්ද කොට්ඨාසය, කොට්ඨාසයේ නම සහ අංකය:" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) "ඡන්ද ප්‍රදේශයේ අක්ෂරයඃ" යන වචන වෙනුවට "ඡන්ද කොට්ඨාසයේ අංකයඃ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) "ඡන්ද කොට්ඨාසයේ අංකයඃ" යන වචන වෙනුවට "කොට්ඨාසයේ නම සහ අංකය ඃ" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**34.** මේ පනතේ, සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.